

# ආඛ්‍යාත ව්‍යාඛ්‍යා



# සංඥාපනය.

පාලිභාෂාව පුහුණුකරවන ආචාර්යවරයන් විසින් ප්‍රථමකොට - නාම - ආඛ්‍යාත - පදමාලා දෙක ස්වකීය ශිෂ්‍යයන්ට මුඛපාඨග්‍රහණය කරවා ඊට අනතුරුව එහි අර්ථකියවීම පෙරපටන්ම පැවතෙනෙණ එක අධ්‍යාපනක්‍රමයකි. දැනුදු එය එසේම කර ගෙණ එනු ලැබේ.

ඒ සම්බන්ධව ශිෂ්‍යාචාර්ය දෙපක්ෂයටම අතිශය ප්‍රයෝජනවත් නාම-ආඛ්‍යාත පදමාලා ව්‍යාඛ්‍යාන කීපයක් උගත් පඬිවරයන් විසින් ප්‍රචලිතකර තිබෙනබව දනිමු.

එසේද වුවත් ඒ ව්‍යාඛ්‍යානයන්හි-ආඛ්‍යාතය පිළිබඳ කොතෙක ශාස්ත්‍රකාරයන් අතින් සැලකිය යුතුවෙතත් ආඛ්‍යාත යට අර්ථකියවාගන්නා ශිෂ්‍යයන්ගේ අභිමතාර්ථ සම්පූර්ණවන සේ පදයක් පාසා අර්ථ කීමේ පිළිවෙලින් අසම්පූර්ණ වෙයි එය ආධුනිකයන්ට බලවත් පාඩුවකි.

මේ කාරණය මෙතෙක්කල බොහෝදෙනකු විසින් එබඳු ව්‍යාඛ්‍යානයක් සම්පාදනය කරවා ආධුනිකයන්අතට පමුණුවන්ට ඇතහොත් එය මහත්වූ ශාස්ත්‍රීය සංග්‍රහයක් වෙනාවා ඇතැයිඅපටද මතක්කරණලදී.

එය මෙතෙක්කල අපවිසින්-කොග්ගල පව ධූපාරාමාධිපතී ශෛලවාසී මල්ලගම සාසනතිලක මහාස්ථවිරපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ; වැද්දුව ගඞ්ගාරාම විහාරවාසීමාතර කිත්තැටියේ සාසනවංශ ස්වාමීන් වහන්සේලවා මේ ව්‍යාඛ්‍යාව සම්පාදනය කරවාගෙණ මෙසේ ප්‍රසිද්ධකරවාලිමු.

“තස්සච්ඡා න විජ්ජන්ති තස්ස නත්ථි අපාගතං”

යනු හෙයින් මෙහි ප්‍රමාදභ්‍රමාදීන්ගෙන් ජනිතවූ යම්කිසි දෝෂයක් විද්‍යමානවේනම් සුධීන් විසින් එය ශාස්ත්‍රගෞරවයෙන් ශුද්ධ කරණු ලැබේවා.

තවද මෙය නැවතමුද්‍රණය කිරීමේ අයිතිය ලංකෝපකාර යන්ත්‍රාලයේ කළමනාකාර තැන වෙතම පවරාගන්නා ලදී.

මෙයට,

ජී. කේ. බී. ධම්මරත්න,

ලංකෝපකාර යන්ත්‍රාලයේ

කළමනාකාර තැන,

2466/1922 ඔක්තෝම්බර් මස

1 වන දිනදීය.

# ආඛ්‍යාත ව්‍යාඛ්‍යා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

ලොකස්ස ලොකෙක ස මෙතෙක චක්ඛුං
දයාපරං සබ්බ විදුං නමිත්වා
ධම්මඤ්ච නිය්‍යානික මග්ග සංඝං
ආඛ්‍යාත ව්‍යාඛ්‍යාන මිදං කරිස්සං

ජිනෙරිතං තෙපිටකම්පි කොචි-
ධාරෙය්‍ය චෙ ධම්ම වසෙන මූළ්හො
ක්‍රියා විභාගස්ස අජානනෙන
සො හොති අන්ධො'ව ගජො අරඤ්ඤෙ

ජානන්ති දක්ඛා භවථප්පමත්තා
නිරුත්තියා පාවචනෙ ච සාධු
ජිනෙමාලි සීසෙ නව සොභනෙව
ජම්ස්සරො කිත්ති යුතොපි රාජා.

"යංතිකාලං ති පුරිසං ක්‍රියාවාචි ති කාරකං
අත්තිලිඞ්ගංද්විවචනං තද 'ඛ්‍යාතන්ති වුච්චති"

යං, යම්පදයෙක් තෙම; තිකාලං, (අතීත අනාගත වර්තමාන යන) කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං, (ප්‍රථම මධ්‍යම උත්තම යන) පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචි, (ගමන් පිසීම් සිටීම් ආදී) ක්‍රියාවාචකද; තිකාරකං, (කර්තෘ කර්ම භාව යන) කාරකත්‍රයක් ඇත්තේද; අත්තිලිඞ්ගං, (ස්ත්‍රී පුරුෂ නපුංසක යන) ලිඞ්ගත්‍රය රහිතද; ද්විවචනං, (එකවචන බහුවචන යන) වචනද්වයක් ඇත්තේද; තං, ඒ පදය තෙම; ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාත යයි; වුච්චති, කියනු ලැබේ.

"වත්තමානා-ති අන්ති සි ථ මි ම තෙ අන්තෙ සෙ වෙහ එ මහෙ" න්‍යාදයො ද්වාදස වත්තමාන සඤ්ඤා හොන්ති.

පච, පච (යන) ධාතු; පාකෙ, පිසීමෙහි (වෙයි) පචති, පච යන; අයං ධාතු, මේ ධාතු තෙම; පාකෙ වත්තතෙ. පිසීමෙහි වැවේ; (හෙවත් පචයන ධාතු පිසීම් අර්ථයෙහි පවතී) "භූවාදිතො අ" යනු කාච්චායන සූත්‍රයි, භූවාදිතො, 'භූසත්තායං' යන ධාතු මුල්කොට ඇති ධාතු (සමූහයා) කෙරෙන් පරව; අ, අප්‍රත්‍යය වේ; මෙහි භූ ආදී ධාතු සමූහය නම් කාත්‍යායන ධාතු මඤ්ජූසාවෙහි "භූසත්තායං" යන්නෙහි පටන්ගෙණ චුරාදීන් දක්වා කියනලද ධාතු සමූහ යයි.

කත්තරි, කර්තෘකාරකයෙහි; (අපිත්තාඩි) වත්තමාන පරස්ස පදෙ, වර්තමාන විභක්ති පරස්සෛ පදයෙහි; (ක්‍රියාපදමාලාව කියනු ලැබේ.)

මෙහි වර්තමානය නම් දැන් පවත්නා කාලයයි. පරස්සෛ පදය යනුද ති, අන්ති, සි, ථ, මි, ම, යන විභක්ති සදෙනාව පුරාණාචාර්‍ය වරයන්ගේ ව්‍යවහාරයෙකි.

සො, හෙතෙම; ඔදනං, බත; පචති, (දැන්) පිසයි; තෙ, ඔහු තුමූ; ඔදනං, බත; පචන්ති, පිසත්; ත්වං, තෝ; ඔදනං, බත; පචසි, පිසෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත, පචථ. පිසහු; අහං, මම; ඔදනං, බත; පචාමි, පිසමි; මයං, අපි; ඔදනං; බත; පචාම, පිසමු;

අත්තනො පදෙ, ආත්මනෙ පදයෙහි (ක්‍රියා පදමාලාව කිය නුලැබේ) ආත්මනෙ පදය යනුදු පුරාතනයන්ගේ ව්‍යවහාරයෙකැයි දතයුතු. මත්තෙහිද පරස්සෛපද ආත්මනෙ පද මෙසේම දතයුතු. ආත්මනෙ පදසංඥලද විභක්තිනම්—තෙ, අන්තෙ, සෙ, ව්හෙ, එ, මෙහ, යන සයයි.

සො, හෙතෙම; ඔදනං, බත; පචතෙ, (දැන්) පිසයි; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචන්තෙ, පිසත්; ත්වං, තෝ, ඔදනං, බත; පචසෙ, පිසෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචව්හෙ, පිසහු; අහං, මම; ඔදනං, බත; පචෙ, පිසමි, මයං, අපි; ඔදනං බත; පචාමෙහ, පිසමු;

(මෙහි 'පචති' යන කර්තෘකාරක ක්‍රියාපදයාවිසින් 'සො' යන ප්‍රථමා විභක්ත්‍යන්ත කර්තෘපදය උක්තකරයි. 'ඔදනං' යන ද්විතීයා විභක්ත්‍යන්තවූ කර්මය අනුක්ත කරයි. යම් කලෙක්හි

කර්තෘ ප්‍රථමාවෙන් යුක්තවේද සියලු තන්හිම ඒ උක්තයි. යම් කලෙක්හි තෘතීයා විභක්තියෙන් සිටිද සියලු තන්හිම ඒ අනුක්තයි. යම් කලෙක්හි කර්මය ප්‍රථමාවෙන් සිටිද සියලු තන්හිම ඒ උක්තයි. යම් කලෙක්හි ද්විතීයා විභක්තියෙන් සිටිද සියලු තන්හිම ඒ අනුක්තයි. මෙසේ සියලු තැනම් උක්තානුක්තා දතයුතු.)

කම්මනි, කර්මකාරකයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ)

තෙන, ඔහුවිසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දූන්) පිසනු ලබයි; තෙන, ඔහු විසින් ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චන්තෙ, පිසනු ලබත්; තෙන, ඔහු විසින්; ඔදනොත්වං, ආහාරවූ තෝ; පච්චසෙ, පිසනු ලැබෙහි; තෙන, ඔහු විසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චව්හෙ, පිසනුලබහු; තෙන, ඔහු විසින්; ඔදනො අහං, ආහාරවූ මම; පච්චෙ, පිසනු ලබමි; තෙන, ඔහු විසින්; ඔදනාමයං, ආහාරවූ අපි; පච්චාමෙහ, පිසනු ලබමු; තෙහි, ඔවුන්විසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දූන්) පිසනුලබයි; තෙහි, ඔවුන්විසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චන්තෙ, පිසනු ලබත්; තෙහි, ඔවුන්විසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ; පච්චසෙ, පිසනුලැබෙහි; තෙහි, ඔවුන්විසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චව්හෙ පිසනු ලබහු; තෙහි, ඔවුන්විසින්; ඔදනො අහං, ආහාරවූ මම, පච්චෙ, පිසනු ලබමි; තෙහි; ඔවුන්විසින්; ඔදනාමයං, ආහාරවූ අපි; පච්චාම්හෙ, පිසනු ලබමු;- ත්වයා, තාවිසින්; ඔදනොසො ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දූන්) පිසනු ලබයි; ත්වයා, තා විසින්; ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චන්තෙ, පිසනු ලබත් ත්වයා, තාවිසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ; පච්චසෙ, පිසනු ලැබෙහි; ත්වයා, තා විසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චව්හෙ, පිසනු ලබහු; ත්වයා, තාවිසින්; ඔදනොඅහං, ආහාරවූ මම; පච්චෙ, පිසනු ලබමි; ත්වයා, තාවිසින්; ඔදනාමයං, ආහාරවූ අපි; පච්චාම්හෙ, පිසනු ලබමු;- තුම්හෙහි, තොපවිසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දූන්) පිසනු ලබයි; තුම්හෙහි, තොපවිසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චන්තෙ, පිසනුලබත්; තුම්හෙහි, තොපවිසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ පච්චසෙ, පිසනුලැබෙහි; තුම්හෙහි, තොපවිසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි, පච්චව්හෙ, පිසනු ලබහු; තුම්හෙහි, තොප

විසින්; ඔදනො අහං, ආහාරවූ මම, පචෙච, පිසනු ලබමි; තුම්හෙහි, තොප විසින්; ඔදනා මයං, ආහාරවූ අපි; පච්චාම්හෙ; පිසනු ලබමු;- මයා, මා විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දුන්) පිසනුලබයි;—එප —අම්හෙහි, අප විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චතෙ, (දුන්) පිසනුලබයි; —එප—අම්හෙහි, අප විසින්; ඔදනා මයං, ආහාරවූ අපි; පච්චාම්හෙ, පිසනු ලබමු;

ආත්මනෙ පදයන් පරස්සපදබවට පැමිණි කල්හි ක්‍රියා පදමාලාව මෙසේයි; පරස්සපද බවට පැමිණීම නම් "අත්ත නොපදානි පරස්සපදත්තං" යන කාත්‍යායන සූත්‍රයෙන් පරස්සපද සංඥාකොට ඒ විභක්ති ලිවීමයි, තෙන, ඔහු විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චති, (දුන්) පිසනු ලබයි; තෙහි, ඔහු විසින්,ඔදනා තෙ, ආහාරවූඔහුතුමූ; පච්චන්ති, පිසනු ලබත්; ඉති ආදයො, මේ ආදී ක්‍රියා පදයෝ (දතයුත්තාහුය හෙවත්) සිඩ කළ යුත්තාහුය.

මෙහි කර්මකාරකයෙහි, තෙන, තෙහි, තයා, තුම්හෙහි, මයා, අම්හෙහි, කියා සියලු තන්හිදීම කර්තෘ තෘතීයා විභක්ති යෙන් යෙදූ බැවින් අනුක්ත කර්තෘයි. සො ඔදනො තෙ ඔදනා යනාදි වශයෙන් කර්මය ප්‍රථමාවෙන්ම යෙදූ හෙයින් සියලු තන්හිම කර්මය උක්තයි. එහෙයින් කර්මකාරක නම්. භාවෙ, භාව කාරකයෙහි (ක්‍රියා පද මාලාව කියනු ලැබේ).

භූ, භූ යන ධාතු; සත්තායං, වීම් අර්ථයෙහි පවතී; තෙන ඔහු විසින්; භූයතෙ, වීමයි; තයා, තා විසින්; භූයතෙ, වීමයි; මයා, මා විසින්, භූයතෙ, වීමයි;- භාවය නම් කර්තෘ කාරක කර්ම කාරක දෙකින් වෙනස්වූ වීම පමණක් ප්‍රකාශකරන්නාවූ ක්‍රියා මාත්‍රයකි, කථා ව්‍යවහාර වශයෙන්, යාම සිටීම, නිදීම, හැඬීම, කීම, යනාදීන් පවත්නේ භාවයයි සේයි

පචති, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්සපද ප්‍රථම පුරුෂ එක වචනයාවූ ආඛ්‍යාත ක්‍රියා පදය, ඔහු විසින් (ඒ ආඛ්‍යාතය විසින්) කියන ලද හෙයින් "සො" යනු උක්ත කර්තෘයි, ඔහුවිසින් නොකියන ලද හෙයින් "ඔදනං" යනු අනුක්ත කර්මයි,- පචන්ති, යනු වර්තමානවිභක්ති

සකර්මක ධාතු කර්තෘකාරක පරස්සපද ප්‍රථම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් "තෙ" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි,- පචසි, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්සපද මධ්‍යම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් "ත්වං" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි,- පචථ, යනු වර්තමානවිභක්ති සකර්මක ධාතු කර්තෘ කාරක පරස්සපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් "තුම්හෙ" යනු උක්තකර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි;- පචාමි, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්සපද උත්තම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් "අහං" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි,- පචාම, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්සපද උත්තම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් "මයං" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි,

පචතෙ, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් "සො" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි, පචන්තෙ, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් "තෙ" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් "ඕදනං" යනු අනුක්තකර්මයි, පචසෙ, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් "ත්වං" යනු උක්ත කර්තෘයි, ඔහු විසින්නොකියන ලද හෙයින් "ඕදනං" යනු අනුක්ත කර්මයි, පචව්හෙ, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘ කාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය,

ඔහු විසින් කියනලද හෙයින් "තුම්හෙ" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියන ලද හෙයින් "ඔදනං" යනු අනුක්ත කර්මයි, පචෙ, යනු වර්තමාන විභක්ති කර්තෘ කාරක ආත්මනෙපද උත්තම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් අහං, යනු උක්ත කර්තෘයි; ඔහු විසින් නොකියනලද හෙයින් "ඔදනං" යනු අනුක්ත කර්මයි,- පචාම්හෙ යනු වර්තමාන විභක්තිසකර්මක ධාතු කර්තෘ කාරක ආත්මනෙපද උත්තම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදය, ඔහු විසින් කියනලද හෙයින් "මයං" යනු උක්ත කර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් " ඔදනං " යනු අනුක්ත කර්මයි.

මේ පිළිවෙළින් මත්තෙහිදු දතයුතු.

වත්තමාන විභත්ති, වර්තමාන විභක්තිය මෙසේයි.

---

"පඤ්චමී තු අන්තු හි ථ මි ම තං අන්තං ස්සු වහො එ ආමසෙ" ත්වාදයො වාදස පඤ්චමී සඤ්ඤා හොන්ති. පඤ්චමියා පරස්සපදෙ, පඤ්චමී විභක්ති පරස්මෛ පදයෙහි (ක්‍රියා පද මාලාව) කියනු ලැබේ.

සො, හෙතෙම; ඔදනං, බත; පචතු, පිසාවා; තෙ, ඔහු තුමූ; ඔදනං, බත; පචන්තු, පිසත්වා; ත්වං, තෝ; ඔදනං, බත; පච පචාහි, පිසගිවා; තුම්හෙ, තෙපි; ඔදනං, බත: පචථ, පිසහුවා, අහං: මම; ඔදනං, බත; පචාමි, පිසම්වා; මයං, අපි; ඔදනං බත; පචාම, පිසමෝවා;—

අත්තනොපදෙ, ආත්මනෙ පදයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ.

සො, හෙතෙම; ඔදනං, බත; පචතං, පිසාවා; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචන්තං, පිසත්වා; ත්වං, තෝ; ඔදනං බත; පචස්සු; පිසගිවා;; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචව්හො, පිසහුවා; අහං, මම; ඔදනං, බත; පචෙ, පිසම්වා; මයං, අපි; ඔදනං, බත පචාමසෙ, පිසමෝවා;

මේ කර්තෘ කාරකයයි. එහි උක්තානුක්ත මුල කී ක්‍රමයෙන් දතයුතු, මෙහි පඤ්චමී යනු පූරාණාචාරීන් විසින් ව්‍යවහාර කරණ ලද රූඪි නාමයකි, මේ විභක්තිය වර්තමාන හෝ වර්තමානයට ආසන්න අනාගත කාලය පිළිබඳ ආශංසනයෙහි හෙවත් ප්‍රාර්ථනාවෙහි හා නියොගාර්ථයෙහි පවතී.

කම්මනි, කම් කාරකයෙහි ක්‍රියා පදමාලාව කියනු ලැබේ.

තෙන, ඔහු විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්ච
තං, පිසනු ලබාවා; තෙන, ඔහු විසින් ඔදනාතෙ, ආහාරවූ
ඔහු තුමූ; පච්චන්තං, පිසනු ලබත්වා; තෙන, ඔහු විසින්
ඔදනොත්වං, ආහාරවූ තෝ; පච්චස්සු, පිසනු ලැබෙහිවා; තෙන,
ඔහු විසින්, ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චව්හො,
පිසනු ලබහුවා; තෙන, ඔහු විසින් ඔදනො අහං, ආහාරවූ
මම; පච්චෙ, පිසනු ලබම්වා; තෙන, ඔහු විසින්; ඔදනාමයං,
ආහාරවූ අපි; පච්චාමසෙ, පිසනු ලබමෝවා; —තෙහි, ඔවුන්
විසින් ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චතං, පිසනු ලබා
වා; තෙහි, ඔවුන් විසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චන්
තං, පිසනු ලබත්වා; ඉති ආදයොපි, මේ ආදී ක්‍රියා පදයෝද
(පළමුකී පරිද්දෙන් යෙදිය යුත්තාහුය)

ආත්මනෙපදයන් පරස්සෙපද බවට පැමිණි කල්හි (ක්‍රියා
පද මාලාව කියනු ලැබේ.)

තෙන, ඔහු විසින්; ඔදනාසො, ආහාරවූ හෙතෙම; පච්ච
තු; පිසනු ලබාවා; තෙන, ඔහු විසින් ඔදනාතෙ, ආහාරවූ ඔහු
තුමූ; පච්චන්තු, පිසනු ලබත්වා; තෙන, ඔහු විසින්; ඔදනොත්වං
ආහාරවූතෝ; පච්ච පච්චාහි පිසනුලැබෙහිවා; තෙන,ඔහුවිසින්
ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චථ, පිසනු ලබහුවා; තෙන,
ඔහු විසින් ඔදනො අහං, ආහාරවූ මම; පච්චාමි, පිසනුලබම්වා;
තෙන, ඔහු විසින්; ඔදනාමයං, ආහාරවූ අපි, පච්චාම, පිසනු
ලබමෝවා-තෙහි, ඔවුන් විසින්; ඔදනාසො, ආහාරවූ හෙතෙ
ම; පච්චතු පිසනු ලබාවා; තෙහි, ඔවුන් විසින්; ඔදනාතෙ, ආ
හාරවූ ඔහු තුමූ පච්චන්තු පිසනු ලබත්වා; ඉති ආදයොපි, මේ
ආදී ක්‍රියා පදයෝද (දතයුත්තාහුය) මේ කම්කාරකයෙහි, මෙහි
විස්තරයද පළමුකී පරිද්දෙන් දතයුතු.

භාවෙ, භාව කාරකයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ.)
තෙන, ඔහු විසින්; භූයතං, වීම වේවා; තයා, තා විසින්; භූයතං
වීම වේවා; මයා, මා විසින්; භූයතං, වීම වේවා;-

පඤ්චමී විභත්ති, පඤ්චමී විභක්තිය මෙසේයි.

"සත්තමී එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාම්හෙ" එය්‍යාදයො ද්වාදස සත්තමී සඤ්ඤා හොන්ති.

සත්තමියා පරස්සපදං, සත්තමී විභක්ති පරස්මෛ පදයෙහි (ක්‍රියාපද මාලාව කියනු ලැබේ.) මේ සත්තමී විභක්තිය වනාහි තුන් කාලය පිළිබඳයි, සත්තමී යනු පඤ්චමී යන්න සෙයින්ම සංඥා මාත්‍රයකි. සෙස්ස පෙරකී නයින් දතයුතු. සො, හෙතෙමේ; ඔදනං, බත; පචෙ පචෙය්‍ය, පිසන්නේය; තෙ, ඔහු තුමූ; ඔදනං, බත; පචෙය්‍යුං, පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං, බත, පචෙය්‍යාසි, පිසන්නෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචෙය්‍යාථ, පිසන්නහු, අහං, මම; ඔදනං, බත; පචෙය්‍යාමි, පිසන්නෙමි; මයං, අපි; ඔදනං, බත; පචෙය්‍යාම, පිසන්නමු;-

අත්තනොපදං, ආත්මනෙ පදයෙහි (ක්‍රියා පද මාලාව කියනු ලැබේ.)

සො, හෙතෙමේ; ඔදනං, බත; පචෙථ, පිසන්නේය; තෙ, ඔහු තුමූ; ඔදනං, බත; පචෙරං, පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං, බත; පචෙථො, පිසන්නෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචෙය්‍යව්හො, පිසන්නහු; අහං, මම; ඔදනං, බත; පචෙය්‍යං, පිසන්නෙමි; මයං, අපි; ඔදනං, බත, පචෙය්‍යාම්හෙ, පිසන්නෙමු; - මේ කර්තෘ කාරකයෙහි ක්‍රියාපද මාලාවයි.

කම්මනි, කර්ම කාරකයෙහි ( ක්‍රියා පද මාලාව කියනු ලැබේ..

තෙන, ඔහු විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චෙථ, පිසනු ලබන්නේය; තෙන, ඔහු විසින්; ඔදනා තෙ, ආහාර වූ ඔහු තුමූ; පච්චෙරං, පිසනු ලබන්නාහුය; තෙන, ඔහු විසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ; පච්චෙථො, පිසනු ලබන්නෙහි; තෙන, ඔහු විසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චෙය්‍යව්හො, පිසනු ලබන්නහු; තෙන, ඔහු විසින්; ඔදනො අහං, ආහාරවූ මම; පච්චෙය්‍යං, පිසනු ලබන්නෙමි; තෙන, ඔහු විසින්; ඔදනා මයං, ආහාරවූ අපි; පච්චෙය්‍යාම්හෙ, පිසනු ලබන්නෙමු; තෙහි, ඔවුන් විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චෙථ; පිසනු ලබන්නේය; තෙහි, ඔවුන්විසින්, ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චෙරං, පිසනු ලබන්නාහුය;

ඉති ආදයොපි, මේ ආදී ක්‍රියා පදයෝද (යෙදියයුත්තාහුය)

ආත්මනෙපදයන් පරස්සෙපද බවට පැමිණි කල්හි (ක්‍රියා පදමාලාව කියනු ලැබේ.

තෙන, ඔහු විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චෙය්‍ය, පිසනු ලබන්නේය; තෙන, ඔහු විසින්; ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චෙය්‍යුං, පිසනු ලබන්නාහුය; තෙන, ඔහු විසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ, පච්චෙය්‍යාසි, පිසනු ලබන්නෙහි; තෙන, ඔහු විසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තෙපි; පච්චෙය්‍යාථ, පිසනු, ලබන්නහු; තෙන, ඔහු විසින්; ඔදනො අහං, ආහාරවූ මම; පච්චෙය්‍යාමි, පිසනු ලබන්නෙමි; තෙන, ඔහු විසින්; ඔදනා මයං, ආහාරවූ අපි; පච්චෙය්‍යාම, පිසනු ලබන්නෙමු:—තෙහි, ඔවුන් විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; පච්චෙය්‍ය, පිසනු ලබන්නේය; තෙහි, ඔවුන් විසින්, ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; පච්චෙය්‍යුං, පිසනු ලබන්නාහුය; ඉති ආදයොපි, මේ ආදී ක්‍රියා පදයෝද (යෙදිය යුත්තාහුය)

භාවෙ, භාවකාරකයෙහි; තෙන, ඔහු විසින්ද; තයා, තා විසින්ද; මයා, මා විසින්ද; භූයෙථ, වීම වන්නේය.

සත්තමී විභත්ති, සප්තමී විභක්තිය නිමියේයි.

---

“ පරොක්ඛා- අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ”
ඉ ආදයො ද්වාදස පරොක්ඛා සඤ්ඤා හොන්ති

පරොක්ඛා පරස්ස පදෙ, පරොක්ෂා විභක්ති පරස්සෙපද යෙහි (ක්‍රියා පදමාලාව කියනු ලැබේ) මෙහි පරොක්ෂා නම් තමන් ඉදිරිපිට නුවූ දෙයක් අනුන්ගෙන් දැනගෙණ කීමයි, මේ වනාහි අතීතකාලය පිළිබඳයි.

සො, හෙතෙම; ඔදනං, බත; පපච, පිසීලු; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පපචු, පිසූලු; ත්වං, තෝ; ඔදනං, බත; පපචෙ, පිසූයෙහිලු; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පපචිත්ථ, පිසුවහුලු; අහං, මම; ඔදනං, බත; පපච පිසීම්ලු; මයං, අපි; ඔදනං, බත; පපචිම්හ, පිසූවමුලු;—

අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි; සො, හෙතෙම; ඔදනං, බත; පපචිත්ථ, පිසීලු; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පපචිරෙ, පිසූලු; ත්වං, තෝ; ඔදනං, බත, පපචිත්ථො, පිසූයෙහිලු; තුම්හෙ

තෙපි; ඔදනං, බත; පපචිව්හෙ, පිසුවහුලු; අහං, මම; ඔදනං, බත; පපචිං, පිසීම්ලු; මයං, අපි; ඔදනං, බත; පපචිම්හෙ, පිසූවමුලු;—

මේ කර්තෘ කාරක යෙහි ක්‍රියාපදමාලාවයි.

කම්මනි, කර්මකාරකයෙහි (ක්‍රියාපදමාලාව කියනුලැබේ) තෙන, ඔහු විසින්; ඔදනොසො, ආහාරවූහෙතෙම; පපචිත්ථ, පිසනුලැබීලු; තෙන, ඔහුවිසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පපචිරෙ, පිසනුලැබූලු; තෙන, ඔහුවිසින්; ඔදනොත්වං, ආහාරවූතෝ; පපචිත්ථො, පිසනුලැබුයෙහිලු, තෙන, ඔහුවිසින්; ඔදනාතුම්හෙ, ආහාරවූතොපි; පපචිව්හෙ, පිසනුලැබූවහුලු; තෙන, ඔහු විසින්: ඔදනොඅහං, ආහාරවූ මම; පපචිං; පිසනුලැබීම්ලු; තෙන, ඔහුවිසින්; ඔදනාමයං, ආහාරවූඅපි; පපචිම්හෙ, පිසනුලැබූවමුලු;- තෙහි, ඔවුන් විසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම, පපචිත්ථ, පිසනු ලැබීලු; තෙහි, ඔවුන්විසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පපචිරෙ, පිසනුලැබූලු;

ඉති ආදයොපි, මේආදී ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය)

ආත්මනෙ පදයන් පරස්සපදබවට පැමිණිකල්හි (ක්‍රියාපදමාලාව කියනුලැබේ) තෙන, ඔහුවිසින්; ඔදනොසො, ආහාරවූහෙතෙම; පපච, පිසනුලැබීලු; තෙන, ඔහුවිසින්; ඔදනාතෙ, ආහාරවූඔහුතුමූ; පපචු, පිසනුලැබූලු; තෙන, ඔහුවිසින්, ඔදනොත්වං; ආහාරවූතෝ පපචෙ, පිසනුලැබුයෙහිලු; තෙන, ඔහුවිසින්, ඔදනාතුම්හෙ, ආහාරවූතොපි; පපචිත්ථ, පිසනුලැබූවහුලු තෙන, ඔහුවිසින්; ඔදනොඅහං, ආහාරවූමම; පපච, පිසනුලැබීම්ලු; තෙන, ඔහුවිසින්; ඔදනාමයං, ආහාරවූ අපි; පපචිම්හ පිසනුලැබූවමුලු;- තෙහි, ඔවුන්විසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම; පපච, පිසනුලැබීලු;

ඉතිආදයොපි, මේආදී ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය)

මේ කර්මකාරකයෙහි ක්‍රියාපදමාලාවයි.

භාවෙ, භාවකාරකයෙහි; තෙන, ඔහුවිසින්ද; තයා, තාවිසින්ද; මයා, මාවිසින්ද; බභූයිත්ථ, විම්විලු;-

පරොක්ඛාවිභත්ති, පරොක්ඛාවිභත්තිය නිමියේයි.

"හීයත්තනී - ආ ඌ ඔ ත්ථ අ ම්හා ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ" ආ ආදයො ද්වාදස හීයත්තනී සඤ්ඤා හොන්ති.

හීයත්තනී පරස්සපදෙ, හීයත්තනීවිභත්ති පරස්සපදයෙහි (ක්‍රියාපදමාලාව කියනුලැබේ) හීයත්තනීනම්, ඊයේපටන් අතීතයෙහි සිදුවූදේ ප්‍රකාශකිරීමයි.

සො, හෙතෙම; ඔදනං බත; අපචා පචා, ඊයේපටන් අතීතයෙහි පිසුයේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචූ පචූ, ඊයේපටන් අතීතයෙහි පිසුවාහුය; ත්වං, තෝ; ඔදනං, බත; අපචො පචො, ඊයේපටන් අතීතයෙහි පිසුයෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; අපචත්ථ පචත්ථ, ඊයේපටන් අතීතයෙහි පිසුවහු; අහං, මම; ඔදනං, බත; අපච පච, ඊයේපටන් අතීතයෙහි පිසුයෙමි; මයං, අපි; ඔදනං, බත; අපචම්හා පචම්හා, ඊයේපටන් අතීතයෙහි පිසුයෙමු;-

අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි (ක්‍රියා පදමාලාව කියනු ලැබේ)

සො, හෙතෙම; ඔදනං, බත; අපචත්ථ පචත්ථ, ඊයේපටින් අතීතයෙහි පිසුයේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචත්ථුං පචත්ථුං, ඊයේපටන් අතීතයෙහි පිසුවාහුය; ත්වං; තෝ; ඔදනං බත; අපචසෙ, පචසෙ, ඊයේපටන් අතීතයෙහි පිසුයෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; අපචව්හං, පචව්හං, ඊයේපටන් අතීතයෙහි පිසුවහු; අහං, මම; ඔදනං, බත; අපචිං පචිං, ඊයේපටන් අතීතයෙහි පිසුයෙමි; මයං, අපි; ඔදනං, බත; අපචාම්හසෙ, පචාම්හසෙ, ඊයේපටන් අතීතයෙහි පිසුයෙමු;—මේ කත්තෘ කාරකයෙහි ක්‍රියාපද මාලාවයි.

කම්මනි, කර්මකාරකයෙහි (ක්‍රියාපදමාලාව කියනුලැබේ) තෙන, ඔහුවිසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; අපච්චත්ථ පච්චත්ථ, ඊයේපටන් අතීතයෙහි පිසනුලැබූයේය; තෙන, ඔහුවිසින්; ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; අපච්චත්ථුං පච්චත්ථුං, ඊයේපටන් අතීතයෙහි පිසනුලැබුවාහුය; තෙන, ඔහුවිසින්, ඔදනො ත්වං, ආහාරවූ තෝ; අපච්චසෙ පච්චසෙ, ඊයේපටන් අතීතයෙහි පිසනු ලැබූයෙහි; තෙන, ඔහුවිසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තොපි; අපච්චව්හං පච්චව්හං, ඊයේපටන් අතීතයෙහි පිසනු ලැබූවහු; තෙන, ඔහුවිසින්; ඔදනො අහං, ආහාරවූ මම; අපච්චිං පච්චිං, ඊයේ පටන් අතීතයෙහි පිසනු ලැබීමි; තෙන, ඔහු

විසින්; ඔදනාමියං ආහාරවූඅපි; අපචාමහසෙ පචාමිහසෙ, ඊයෙප්පමින්අතීතයෙහි පිසනු ලැබූයෙමු; තෙපි, ඔවුන්විසින්; ඔදනොසො, ආහාරවූහෙතෙම; අපචවත්ථ පචවත්ථ, ඊයේ පමන් අතීතයෙහි පිසනු ලැබූයෙය;

ඉති ආදයොපි, මේආදි ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය)

ආත්මනෙපදයන් පරස්මෛපදබවට පැමිණිකල්හි (ක්‍රියාපද මාලාව කියනුලැබේ) තෙත, ඔහුවිසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම; අපචවාපචවා, ඊයෙප්පටන් අතීතයෙහි පිසනු ලැබූයේය; තෙත, ඔහුවිසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුහුමු; අපචවු පචවු, ඊයෙප්පටන් අතීතයෙහි පිසනු ලැබූවාහුය; තෙත, ඔහු විසින්; ඔදනොත්වං, ආහාරවූතෝ; අපචෙවාපචෙවා, ඊයෙප්පටන්, අතීතයෙහි පිසනු ලැබූයෙහි; තෙත, ඔහු විසින්;ඔදනාතුම්හෙ, ආහාරවූ තොපි; අපචවත්ථ පචවත්ථ ඊයෙප්පටන් අතීතයෙහි පිසනුලැබූවහු; තෙත, ඔහු විසින්; ඔදනොඅහං, ආහාරවූ මම; අපචව පචව, ඊයෙප්පටන් අතීතයෙහි පිසනුලැබූයෙමි; තෙත, ඔහුවිසින්; ඔදනාමයං ආහාරවූ අපි; අපචවම්හා පචවම්හා, ඊයෙප්පටන් අතීතයෙහි පිසනුලැබීමු; තෙපි, ඔවුන්විසින්; ඔද නොතෙසො, ආහාරවූහෙතෙම; අපචවා පචවා, ඊයෙප්පටන් අතීත යෙහි පිසනුලැබූයෙය;

ඉති ආදයොපි, මේ ආදි ක්‍රියාපදයෝද (යෙදියයුත්තාහුය)

භාවේ, භාවකාරකයෙහි-තෙත, ඔහුවිසින්ද; තයා, තා, විසින්ද; මයා, මාවිසින්ද; අභූයත්ථ භූයත්ථ, ඊයේ පමන් අතීතයෙහි විම වූයේය;

හීයත්තනී විභත්ති, හීයත්තනී විභක්තිය මෙසේයි;

---

"අජ්ජතනී-ඊ උං ඔත්ථ ඉංම්හා ආ ඌ සෙ වහං අ ම්හෙ" ඊ ආදයො චාදස අජ්ජතනී සඤ්ඤාහොන්ති.

අජ්ජතනී පරස්සපදෙ, අජ්ජතනී විභත්ති පරස්මෛපද යෙහි ක්‍රියාපදමාලාව කියනුලැබේ) මෙහි අජ්ජතනීනම්, ඊයේ රාත්‍රිය සෙරෙන් අඩියක් නොහොත් දසපැයක් ඉකුත්වූ තැන්පටන් මෙපිට අද දවසයයි දතයුතු; ඒ අද දවසෙහිවූ අතීතයද් ජිනැසින් දක්ක කීමයයිසේයි.

සො, හෙතෙම; ඔදනං, බත; අපචි පචි අපචී පචී, (අතීත රාත්‍රියෙහි පශ්චිම යාමයෙහි පටන්) අද පිසූයේය; තෙ, ඔහු තුමූ, ඔදනං, බත; අපචිංසු පචිංසු අපචුං පචුං, අද පිසූවාහුය; ත්වං, තෝ; ඔදනං, බත; අපචො පචො, අද පිසූයෙහි; තුම්හෙ, තොපි; ඔදනං, බත; අපචිත්ථ පචිත්ථ, අද පිසූවහු; අහං, මම; ඔදනං, බත; අපචිං පචිං, අද පිසූයෙමි; මයං, අපි; ඔදනං, බත; අපචිම්හා පචිම්හා, අදපිසූයෙමු;- අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ) සො, හෙතෙම; ඔදනං, බත; අපචා පචා (අතීතරාත්‍රියෙහි පශ්චිමයාමයෙහි පටන්) අද පිසූයේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචූ පචූ, අද පිසූවාහුය; ත්වං, තෝ; ඔදනං, බත; අපචිසෙ පචිසෙ, අද පිසූයෙහි; තුම්හෙ, තොපි; ඔදනං, බත; අපචිව්හං පචිව්හං, අද පිසූවහු; අහං, මම; ඔදනං, බත; අපච පච, අද පිසූයෙමි; මයං, අපි; ඔදනං, බත; අපචිම්හෙ පචිම්හෙ, අද පිසූයෙමු;-මේ කර්තෘකාරකයයි, මේ විභක්තිය ද හීයත්තනී විභක්තිය සෙයින් අතීතකාලය පිළිබඳයි.

කම්මනි, කර්මකාරකයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ)

තෙන, ඔහු විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; අපච්චා පච්චා, (අතීත රාත්‍රියෙහි පශ්චිමයාමයෙහි පටන්) අද පිසනු ලැබූයේය; තෙන, ඔහුවිසින්, ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; අපච්චූ පච්චූ, අදපිසනුලැබූවාහුය; තෙන, ඔහුවිසින්; ඔදනො ත්වං, ආහාරවූ තෝ; අපච්චිසෙ පච්චිසෙ, අද පිසනු ලැබූයෙහි; තෙන, ඔහුවිසින්; ඔදනා තුම්හෙ, ආහාරවූ තොපි; අපච්චිව්හං පච්චිව්හං, අද පිසනු ලැබූවහු; තෙන, ඔහුවිසින්; ඔදනො අහං, ආහාරවූ මම; අපච්ච පච්ච, අද පිසනු ලැබූයෙමි; තෙන, ඔහු විසින්; ඔදනා මයං, ආහාරවූ අපි; අපච්චිම්හෙ පච්චිම්හෙ, අද පිසනුලැබූයෙමු;-තෙහි, ඔවුන් විසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; අපච්චා පච්චා, අද පිසනුලැබූයේය; ඉති ආදයොපි, මේ ආදී ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය)

ආත්මනෙපදයන් පරස්මෛපදබවට පැමිණිකල්හි (ක්‍රියාපදමාලාව කියනුලැබේ) තෙන, ඔහුවිසින්; ඔදනො සො, ආහාරවූ හෙතෙම අපච්චි පච්චි අපච්චී පච්චී, අතීතරාත්‍රියෙහි ප ශ්චිම යාමයෙහි පටන්) අද පිසනු ලැබූයේය; තෙන, ඔහු විසින්; ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; අපච්චිංසු පච්චිංසු අපච්චුං පච්චුං, අද පිසනු ලැබූවාහුය; තෙන, ඔහුවිසින්, ඔදනො ත්වං,

ආහාරවූ තෝ; අපචො පචො, අද පිසනු ලැබුයෙහි; තෙන, ඔහුවිසින්; ඔදනාතුම්හෙ, ආහාරවූ තොපි; අපචිත්ථ පචිත්ථ, අද පිසනු ලැබුවහු; තෙන, ඔහුවිසින්; ඔදනොඅහං, ආහාරවූ මම්; අපචිං පචිං, අද පිසනු ලැබුයෙමි; තෙන, ඔහුවිසින්; ඔදනාමයං, ආහාරවූඅපි; අපචිම්හා පචිම්හා; අද පිසනු ලැබුයෙමු;-තෙහි; ඔවුන් විසින්; ඔදනොසො, ආහාරවූ හෙතෙම අපචි පචි අපචී පචී, අද පිසනු ලැබුයේය; ඉති ආදයොපි මේ ආදී ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය)

භාවෙ, භාවකාරකයෙහි; තෙන, ඔහු විසින්ද; තයා, තා විසින්ද; මයා, මා විසින්ද; අභුවා භූයා, (අතීත රාත්‍රියගේ පශ්චිම යාමයෙහි පටන්) අදවීම වූයේය;-

අජ්ජතනිවිභත්ති, අජ්ජතනීවිභත්තිය මෙසේයි;

---

"භවිස්සන්ති ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හෙ" ස්සන්තාදයො ද්වාදස භවිස්සන්ති සඤ්ඤා හොන්ති.

භවිස්සන්ති පරස්සපදෙ, භවිස්සන්ති විභත්ති පරස්මෛපදයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ) මෙහි භවිස්සන්තීනම්, අනාගතයෙහි සිදුවන්නාවූ යමක් ප්‍රකාශකිරීමයි.

සො, හෙතෙම; ඔදනං, බත; පචිස්සති, මතුකාලයෙහි පිසන්නේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචිස්සන්ති; මතුකාලයෙහි පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං, බත, පචිස්සසි, මතුකාලයෙහි පිසන්නෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචිස්සථ, මතු කාලයෙහි පිසන්නහු; අහං, මම; ඔදනං, බත; පචිස්සාමි, මතුකාලයෙහි පිසන්නෙමි; මයං, අපි; ඔදනං, බත; පචිස්සාම, මතුකාලයෙහි පිසන්නෙමු;

අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ) සො, හෙතෙම; ඔදනං බත; පචිස්සතෙ, මතුකාලයෙහි පිසන්නේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචිස්සන්තෙ, මතුකාලයෙහි පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං,බත,පචිස්සසෙ, මතුකාලයෙහි පිසන්නෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචිස්සව්හෙ මතුකාලයෙහි පිසන්නහු; අහං, මම; ඔදනං, බත; පචිස්සං, මතුකාලයෙහි පිසන්නෙමි, මයං, අපි; ඔදනං බත; පචිස්සාම්හෙ මතුකාලයෙහි පිසන්නෙමු;—මේ කර්තෘකාරකයයි.

කම්මනි, කර්මකාරකයෙහි—තෙන, ඔහුවිසින්; ඔදනොසො; ආහාරවූ හෙතෙම; පචිස්සතෙ, මතුකාලයෙහි පිසනුලබන්නේය; තෙන, ඔහුවිසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පචිස්සන්තෙ, මතුකාලයෙහි පිසනුලබන්නාහුය; තෙන, ඔහුවිසින්; ඔදනොත්වං ආහාරවූතෝ; පචිස්සසෙ, මතුකාලයෙහි පිසනුලබන්නෙහි; තෙන, ඔහුවිසින්; ඔදනාතුම්හෙ, ආහාරවූ තෙපි; පචිස්සව්හෙ, මතුකාලයෙහි පිසනු ලබන්නාහු; තෙන, ඔහුවිසින්; ඔදනොඅහං, ආහාරවූ මම; පචිස්සං, මතුකාලයෙහි පිසනු ලබන්නෙමි; තෙන ඔහුවිසින්; ඔදනාමයං, ආහාරවූඅපි; පචිස්සාම්හෙ, මතුකාලයෙහි පිසනුලබන්නෙමු;—තෙහි, ඔවුන්විසින්; ඔදනොසො ආහාරවූ හෙතෙම; පචිස්සතෙ, මතුකාලයෙහි පිසනුලබන්නේය; ඉති ආදයොපි, මේ ආදී ක්‍රියාපදයෝද (යෙදියයුත්තාහුය)

ආත්මනෙපදයන් පරස්මෛපද බවට පැමිණි කල්හි (ක්‍රියාපදමාලාව කියනු ලැබේ) තෙන, ඔහුවිසින්; ඔදනොසො ආහාරවූ හෙතෙම; පචිස්සති, මතුකාලයෙහි පිසනු ලබන්නේය; තෙන, ඔහුවිසින්; ඔදනාතෙ, ආහාරවූ ඔහුතුමූ; පචිස්සන්ති මතුකාලයෙහි පිසනුලබන්නාහුය; ඉති ආදයොපි, මේආදී ක්‍රියාපදයෝද; (යෙදියයුත්තාහුය) තෙහි, ඔවුන්විසින්; ඔදනොසො, ආහාරවූහෙතෙම; පචිස්සති, මතු කාලයෙහි පිසනු ලබන්නේය; ඉති ආදයොපි, මේආදී ක්‍රියාපදයෝද, (යෙදියයුත්තාහුය)

භාවෙ, භාවකාරකයෙහි; භූයිස්සතෙ, මතුකාලයෙහි වීමයි;

භවිස්සන්ති විභත්ති, භවිස්සන්ති විභත්තිය මෙසේයි,

---

"කාලාතිපත්ති ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ" ස්සාදයො ද්වාදස කාලාතිපත්ති සඤ්ඤා හොන්ති.

කාලාතිපත්ති පරස්සපදෙ, කාලාතිපත්ති විභත්ති පරස්මෛපදයෙහි; (ක්‍රියාපදමාලාව කියනුලැබේ) මෙහි කාලාතිපත්ති, නම්, ක්‍රියාවක් සිදුවීමට තවත් හෙතුවක් ඇතිව පැවැත්මයි යම්කිසිලෙසකින් ඒ හෙතුව වැරදගියේනම් ක්‍රියාවද සිදුනොවෙයි, මහදත සිටුපුත්තෙම කිසිලෙසකින් පළමු වයසෙහිදී

පැවිදිවූයේනම් රහත්වූයේය. මෙහිදී රහත්වීම නියමව තිබුනේ විනුමුත් ඒ රහත්වීමට හේතුවූ පැවිදිවීම වැරදගියා බැවින් රහත්වීමද වැරදගියේය. මෙහි ක්‍රියාසිද්ධවීම අතීතකාලය පිළිබදව පවතී.

සො, හෙතෙම; තණ්ඩුලං අලභිස්සා, සහල් ලැබුයේනම්; ඔදනං අපචිස්සා, පචිස්සා, බත පිසූයේය; තෙ, ඔහුතුමූ, තණ්ඩුලං අලභිස්සංසු, සහල් ලැබුවාහුනම්; ඔදනං අපචිස්සංසු පචිස්සංසු, බත පිසූවාහුය; ත්වං, තෝ; තණ්ඩුලං අලභිස්සෙ, සහල් ලැබුයෙහිනම්; ඔදනං අපචිස්සෙ පචිස්සෙ, බත පිසූයෙහි, තුම්හෙ තෙපි; තණ්ඩුලං අලභිස්සථ, සහල් ලැබූවහුනම්; ඔදනං අපචිස්සථ පචිස්සථ, බත පිසූවහු; අහං, මම; තණ්ඩුලං අලභිස්සං සහල් ලැබුයෙම්නම්; ඔදනං අපචිස්සං පචිස්සං, බත පිසූයෙමි, මයං, අපි; තණ්ඩුලං අලභිස්සම්හා, සහල් ලැබුයෙමුනම්; ඔදනං අපචිස්සම්හා පචිස්සම්හා, බත පිසූයෙමු;

අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි,-සො, හෙතෙම; තණ්ඩුලං අලභිස්සථ, සහල් ලැබුයේනම්; ඔදනං අපචිස්සථ පචිස්සථ බත පිසූයේය; තෙ, ඔහුතුමූ; තණ්ඩුලං අලභිස්සිංසු, සහල් ලැබුවාහුනම්; ඔදනං අපචිස්සිංසු පචිස්සිංසු, බත පිසූවාහුය; ත්වං, තෝ; තණ්ඩුලං අලභිස්සසෙ, සහල් ලැබුයෙහිනම්; ඔදනං අපචිස්සසෙ පචිස්සසෙ, බත පිසූයෙහි; තුම්හෙ, තෙපි; තණ්ඩුලං අලභිස්සව්හෙ, සහල් ලැබූවහුනම්; ඔදනං අපචිස්සව්හෙ පචිස්සව්හෙ, බත පිසූවහු; අහං, මම, තණ්ඩුලං අලභිස්සං, සහල් ලැබුයෙම්නම්; ඔදනං අපචිස්සං පචිස්සං, බත පිසූයෙමි; මයං, අපි; තණ්ඩුලං අලභිස්සාම්හසෙ, සහල් ලැබුයෙමුනම්, ඔදනං අපචිස්සාම්හසෙ පචිස්සාම්හසෙ, බත පිසූයෙමු;-මේ කර්තෘකාරකයයි.

කම්මනි, කර්මකාරකයෙහි;-තෙන, ඔහුවිසින්; උපකරණං ලභිස්සථ, උපකරණලද්දේනම්; ඔදනො සො, ආහාරවූ හෙතෙම; අපච්චිස්සථ පච්චිස්සථ, පිසනු ලැබුයේය; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනා තෙ, ආහාරවූ ඔහුතුමූ; අපච්චිස්සිංසු පච්චිස්සිංසු, පිසනු ලැබුවාහුය; තෙන, ඔහුවිසින්; උපකරනං ලභිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනො ත්වං ආහාරවූතෝ; අපච්චිස්සසෙ පච්

චිස්සසෙ, පිසනුලැබූයෙහි; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාතුම්හෙ, ආහාරවූ තොපි; අපච්විස්සව්හෙ පච්විස්සව්හෙ, පිසනුලැබූවහු; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණලද්දේනම්; ඔදනොඅහං, ආහාරවූ මම; අපච්විස්සං පච්විස්සං, පිසනුලැබූයෙමි; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාමයං, ආහාරවූ අපි; අපච්චිස්සාම්හසෙ පච්චිස්සාම්හසෙ, පිසනු ලැබූයෙමු; තෙහි, ඔවුන්විසින්; උපකරණං ලභිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාසෙ, ආහාරවූ හෙතෙම; අපච්විස්සථ පච්විස්සථ, පිසනුලැබූයේය; ඉති ආදනොපි, මේ ආදී ක්‍රියාපදයෝද (යෙදිය යුත්තාහුය) ආත්මනෙපදයන්; පරස්මෛපදබවට පැමිණිකල්හි(ක්‍රියාපදමාලාව කියනුලැබේ) තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්ස, උපකරණ ලද්දේනම්; ඔදනොසෙයා, ආහාරවූ හෙතෙම; අපච්විස්සා පච්විස්සා, පිසනු ලැබූයේය; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාසෙ, ආහාරවූඔහුතුමූ; අපච්විස්සංසු පච්විස්සංසු, පිසනු ලැබූවාහුය; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනොත්වං, ආහාරවූතෝ; අපච්විස්සෙ පච්විස්සෙ, පිසනුලැබූයෙහි; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාතුම්හෙ; ආහාරවූතොපි; අපච්විස්සථ පච්විස්සථ, පිසනු ලැබූවහු; තෙන, ඔහුවිසින් උපකරණං ලභිසිස්සථ,උපකරණලද්දේනම්;ඔදනොඅහං, ආහාරවූ මම; අපච්විස්සං පච්විස්සං, පිසනුලැබූයෙමි; තෙන, ඔහුවිසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණලද්දේනම්; ඔදනාමයං, ආහාරවූ අපි, අපච්විස්සාම්හා පච්විස්සාම්හා, පිසනු ලැබූයෙමු;-තෙහි, ඔවුන්විසින්; උපකරණං ලභිසිස්සථ, උපකරණ ලද්දේනම්; ඔදනාසෙ, ආහාරවූහෙතෙම; අපච්විස්සා පච්විස්සා, පිසනුලැබූයේය; ඉති ආදනොපි, මේ ආදී ක්‍රියාපදයෝද (යෙදියයුත්තාහුය)

භාවෙ, භාවකාරකයෙහි; අභූයිස්සථ භූයිස්සථ, උපකරණ ලද්දේනම් වීම වූයේය;-

කාලාතිපත්ති, කාලාතිපත්ති විභත්තිය මෙසේයි.

---

වත්තමානෙ හෙත්වත්ථෙ-ධාතූහි ණෙ ණය ණාපෙ ණාපයා කාරිතානි හොන්ති.

වත්තමානෙ හෙත්වත්ථෙ, වර්තමාන විභක්ති හෙත්වර්ථයෙහි (ක්‍රියාපදමාලාව කියතුලැබේ) මෙහි හෙත්වර්ථනම්, කෙනෙක් යම්කිසි ක්‍රියාවක් අන්කෙනෙකු ලවා හෙවත් තමාගේ ආඥාවෙන් කරවීමයි.

කත්තරිපරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි (ක්‍රියා සිඬීගු මෙසේයි) ණෙ,ණෙප්‍රත්‍යයවේ; (පච යන ධාතුහු කෙරෙන් ණෙ ප්‍රත්‍යය කොට සාදන ක්‍රියාවේ වරනැගීම හෙවත් පදමාලාව කියම් යතු භාවයි) සො,හෙතෙම; ඔදනං, බත; පාචෙති, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචෙන්ති,පිසවත්; ත්වං, තෝ; පාචෙසි, පිසවයි; තුම්හෙ, තෙපි; පාචෙථ, පිසවහු; අහං, මම; පාචෙමි, පිසවමි; මයං, අපි; පාචෙම, පිසවමු; අත්තනො පදෙ, ආත්මනෙ පදයෙහි,—සො, හෙතෙම; ඔදනං, බත; පාචෙතෙ, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචෙන්තෙ, පිසවත්; ත්වං, තෝ; පාචෙසෙ, පිස වයි; තුම්හෙ, තෙපි; පාචෙව්හෙ, පිසවහු; අහං, මම; පාචෙ, පිසවමි; මයං, අපි; පාචෙම්හෙ, පිසවමු;

ණය, ණයප්‍රත්‍යයවේ; සො, හෙතෙම; ඔදනං, බත; පාචයති, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචයන්ති, පිසවත්; ත්වං, තෝ; පාචයසි, පිසවයි; තුම්හෙ, තෙපි; පාචයථ, පිසවහු; අහං, මම; පාචයාමි, පිසවමි; මයං, අපි; පාචයාම, පිසවමු, අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි— සො, හෙතෙම; ඔදනං, බත; පාචයතෙ, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචයන්තෙ, පිසවත්; ත්වං. තෝ; පාචයසෙ, පිසවයි; තුම්හෙ, තෙපි; පාචයව්හෙ, පිසවහු; අහං, මම; පාචයෙ, පිසවමි; මයං, අපි; පාචයාම්හෙ, පිසවමු;

ණාපෙ, ණාපෙ ප්‍රත්‍යයවේ; සො, හෙතෙම; ඔදනං, බත; පාචාපෙති, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචාපෙන්ති, පිසවත්; ත්වං, තෝ; පාචාපෙසි, පිසවයි; තුම්හෙ, තෙපි; පාචාපෙථ, පිසවහු අහං, මම; පාචාපෙමි, පිසවමි; මයං, අපි: පාචාපෙම, පිසවමු; අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි—සො; හෙතෙම; ඔදනං, බත; පාචාපෙතෙ, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචාපෙන්තෙ, පිසවත්; ත්වං, තෝ; පාචාපෙසෙ, පිසවයි, තුම්හෙ, තෙපි; පාචාපෙව්හෙ, පිසවහු; අහං, මම; පාචාපෙ, පිසවමි; මයං, අපි; පාචාපෙම්හෙ, පිසවමු;

ණාපය, ණාපය ප්‍රත්‍යයවේ; සො, හෙතෙම; ඔදනං, බත; පාචාපයති, පිසවයි; තෙ, ඔහුතුමූ; පාචාපයන්ති, පිසවත්; ත්වං, තෝ; පාචාපයසි, පිසවති; තුම්හෙ, තෙපි; පාචාපයථ, පිසවහු; අහං; මම; පාචාපයාමි, පිසවමි; මයං, අපි; පාචාපයාම, පිසවමු;

අත්තනොපදෙ, ආත්මනෙපදයෙහි-සො, හෙතෙම; ඔදනං, බත; පාචාපයතෙ, පිසවයි; තෙ, ඔහුතුමූ පාචාපයන්තෙ, පිසවත්; ත්වං, තෝ; පාචාපයසෙ, පිසවති; තුම්හෙ, තෙපි; පාචාපයව්හෙ, පිසවහු; අහං, මම; පාචාපයෙ, පිසවමි; මයං, අපි; පාචාපයාම්හෙ, පිසවමු; ඉතිආදි, මෙආදිය; අඪවිභක්තීසු, විභක්තීන් අවදෙනා කෙරෙහි; (හෙවත් වර්තමානාදි විභක්තිඅටෙහිම) ඥෙයයං, දතයුතු; (පඤ්චමී සප්තමී ආදි විභක්තීන්ද හෙත්වර්ථ ප්‍රත්‍යයුක්තයකොට මේ ක්‍රමයෙන් දතයුතුය යන අභිප්‍රායි

භූවාදි, (භූආදි ධාතු සමූහයා කෙරෙන් පරකොට "ති"ආදි ආඛ්‍යාත විභක්තීන් යොදා ක්‍රියාපදයෙදීම මෙහෙයි)භූවාදි ධාතු ගණයයි.

රුධි, රුධි යන ධාතු; ආවරණෙ, වැසීම් අර්ථයෙහි පවතී; 'රුධාදිතො නිග්ගහීත පුබ්බඤ්ච" යනු කාත්‍යායන සූත්‍රයි; "රුධි" යන ධාතුලියා ධිකාරයාගෙන් පූර්වයෙහි නිග්ගහීතාගම කොට ධාත්වන්තයා කෙරෙන් පරව අප්‍රත්‍යයද ඉන්පසු ති විභක්තිද ලියයුතු:

සො, හෙතෙම; මග්ගං, මාර්ගය; රුන්ධති, වසයි; තෙ, ඔහුතුමූ රුන්ධන්ති, වසත්; ත්වං, තෝ; රුන්ධසි, වසති; (ආවරණය කෙරෙති) තුම්හෙ, තෙපි; රුන්ධථ, වසහු; අහං, මම; රුන්ධාමි, වසමි; මයං, අපි; රුන්ධාම, වසමු; (හෙවත් ආවරණයකරමු) මේ පරස්මෛපදයි, රුන්ධතෙ, වසයි; රුන්ධන්තෙ, වසත්; රුන්ධසෙ වසති; (වැසීමකෙරෙති) රුන්ධව්හෙ, වසහු; රුන්ධෙ, වසමි; රුන්ධාම්හෙ, වසමු;—ඉතිආදි, මෙආදිය; අඪවිභත්තීසු, විභත්තීන්, අවදෙනා කෙරෙහිද; හෙත්වත්ථෙච, හෙත්වර්ථයෙහිද; ඥෙයයං දතයුතු;

රුධාදි, රුධාදි ධාතු ගණයයි;

දිවු, දිවුයන ධාතු; කීළාදිම්හි, ක්‍රීඩාකිරීම් ආදීයෙහි පවතී "දිවාදිතොය" යනු කාත්‍යායන සූත්‍රයි; දිවුආදි ධාතු සමූහයාකෙරෙන් පරව මෙකී සූත්‍රයෙන් යප්‍රත්‍යය වේ;

දිබ්බති, ක්‍රීඩාකරයි; දිබ්බන්ති, ක්‍රීඩාකරත්; දිබ්බසි, ක්‍රීඩාකෙරෙහි; දිබ්බථ, ක්‍රීඩාකරහු; දිබ්බාමි, ක්‍රීඩාකරමි; දිබ්බාම, ක්‍රීඩාකරමු; ඉති ආදි, මේ ආදිය; දිවාදි, දිවාදි ධාතුසමූහයාගේ ක්‍රමයයි;

---

සු, සු යන ධාතු; සවණෙ, ඇසීමෙහි පවතී; "ස්වාදිතො ණුණාඋණාච "යන සූත්‍රයෙන්, මේධාතු සමූහයා කෙරෙන්පරව, ණු ප්‍රත්‍යයද ණාප්‍රත්‍යයද උණාප්‍රත්‍යයද වේ; සො, හෙතෙම; ධම්මං, ධර්මය; සුණොති; අසයි; සුණන්ති; අසත් සුණොසි, අසහි; (ශ්‍රවණයකෙරෙහි) සුණොථ, අසහු; සුණොමි, අසමි ;සුණොම, අසමු; ණාපච්චයෙ, ණාප්‍රත්‍යයායුක්තවූ කල්හි; සුණාති, අසයි; සුණන්ති, අසත්; සුණාසි, අසහි; සුණාථ, අසහු; සුණාමි, අසමි; සුණාම, අසමු;- අප, "අප" යන ධාතු; පාපුණනෙ, පැමිණීම් අර්ථයෙහි පවතී; පපුබ්බො, "ප" යන උපසර්ගය පූර්වවෙයි; උණාපච්චයො, ධාතුහු කෙරෙන් පරව උණාප්‍රත්‍යය වේ; සො, හෙතෙම; සුඛං පාපුණාති, සුවයටපැමිණෙයි; තෙ, ඔහුතුමූ; පාපුණන්ති, පැමිණෙත්; ත්වං, තෝ; පාපුණාසි, පැමිණෙහි; තුම්හෙ, තෙපි, පාපුණාථ, පැමිණෙන්නහු; අහං, මම; පාපුණාමි, පැමිණෙමි; මයං, අපි, පාපුණාම, පැමිණෙමු; ඉති ආදයො, මේආදීහු; ස්වාදි, සු ආදී ධාතුගණයයි, දතයුතු;

---

කී, "කී" යන ධාතු; දබ්බවිනිමයෙ; ද්‍රව්‍ය ගණුදෙනුකිරීමෙහි (හෙවත් වෙළඳාම්කිරීම් අර්ථයෙහි) පවතී, "කියාදිතො ණා" යනු සූත්‍රයි; මේ සූත්‍රයෙන්, කී ආදි ධාතූන්කෙරෙන් පරව ණා ප්‍රත්‍යයවෙයි; සො, හෙතෙම; වත්ථං, වස්ත්‍රය; කිණාති, විකුණයි; (හෙවත් මිලයටගණියි) තෙ, ඔහුතුමූ, කිණන්ති, විකුණත්; ත්වං; තෝ; කිණාසි, විකුණහි; තුම්හෙ, තෙපි; කිණාථ, විකුණහු; අහං, මම; කිණාමි, විකුණමි; මයං, අපි, කිණාම, විකුණමු; ඉති ආදි, මේ ආදි ක්‍රියාපදමාලාව; කීයාදි, කීආදි ධාතුගණයයි දන්නේයි;

---

ගහ "ගහ" යන ධාතු; උපාදනෙ, ගැණීම්අර්ථයෙහි පවතී; "ගහාදිතොප්පණ්හාච, යනු සූත්‍රයි; "ගහ" ආදි ධාතූන්කෙරෙන් පරව මේ සූත්‍රයෙන්, ප්ප, ණ්හ, යන ප්‍රත්‍යයෝ දෙදෙනෙක්වෙති; ගෙප්පති, ගණී; සො, හෙතෙම; සික්ඛං, සික්ෂාව

ගණ්හාති, ගණී, තෙ, ඔහුතුමූ; ගණ්හන්ති, ගණිත්; ත්වං, තෝ; ගණ්හාසි, ගන්නෙහි; තුම්හෙ, තොපි; ගණ්හථ, ගන්නහු; අහං, මම; ගණ්හාමි, ගණිමි; මයං, අපි; ගණ්හාම, ගණිමු; ඉති ආදි, මේ ආදිය; ගහාදි, ගහආදි ධාතු ගණයයි දන්නේයි;

---

කර, කරයන ධාතු; කරණෙ, කිරීමෙහි වේ; "තනාදිතො ඔසිරා" යනු සූත්‍රයි;

"තනු" ආදි ධාතු සමූහයාකෙරෙන් පරව "ඔ" ප්‍රත්‍යය හා, "සිර" ප්‍රත්‍යයද වෙති, මේ කරයන ධාතුද තනාදි ගණයට ඇතුළත්හෙයින් ඔහු කෙරෙන්ද මේ ප්‍රත්‍යය දෙදෙනවෙති:

සො, හෙතෙම; පුඤ්ඤං කරොති, පින්කරයි; තෙ, ඔහුතුමූ; කරොන්ති, කරත්; ත්වං, තෝ; කරොසි, කෙරෙහි; තුම්හෙ, තොපි; කරොථ, කරහු; අහං, මම; කරොමි, කරමි; මයං, අපි; කරොම, කරමු;- සිරප්පච්චයෙ, ධාතුහු කෙරෙන් පරව "සිර" ප්‍රත්‍යය පිහිටුවූ කල්හි, කයිරති, යනුවේ; කරයි යනාර්ථයි. ඉති ආදි, මේ ආදිය; තනාදි, තනුආදි ධාතු ගණයයි දතයුතු.


---

චුර, "චුර" යන ධාතු; ථෙය්‍යෙ, සොරකම්කිරීමෙහිවේ; "චුරාදිතො ණෙණයා" යනු සූත්‍රයි; චුරාදි ධාතූන්කෙරෙන් පරව, මේ සූත්‍රයෙන්, ණෙ, ණය, ප්‍රත්‍යයෙදෙදෙනවෙති; සො, හෙතෙම; භණ්ඩං, බඩුව; චොරෙති, සොරාගණී; තෙ, ඔහුතුමූ; චොරෙන්ති, සොරාගණිත්; ත්වං, තෝ; චොරෙසි, සොරාගන්නෙහි; තුම්හෙ, තොපි; චොරෙථ, සොරාගන්නහු; අහං, මම; චොරෙමි, සොරාගණිමි; මයං, අපි; චොරෙම, සොරාගණිමු; ඉති ආදයො, මේ ආදි ක්‍රියාපද; චුරාදි, චුරාදි ධාතුගණයයි දතයුතු.

තිආදයො, "ති" යනු මුල්කොට ඇති ආඛ්‍යාත විභක්තීහු ඉති, මෙසේයි.

නිමි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු